## සිසු පැවරුම්

(04) ''ජනාධිපතිවරයා පිළිගෙන ප්‍රධාන පීඨිකාව වෙත කැඳවාගෙන යාම ආචාර පෙළපාළිය විසින් සිදුකරන ලදී.''
ඉහත වාක්‍ය ඛණ්ඩය උත්සව අවස්ථාවක දී නිවේදනය කරන ලද්දකි.

1. ආචාර පෙළපාළිය භාවිත වන අවස්ථා 03ක් ලියා දක්වන්න.
2. ආචාර පෙළපාළියක දකුණට හැරීම සඳහා දෙනු ලබන විධානය ලියා දක්වන්න.
3. ආචාර පෙළපාළියක ප්‍රධාන භ්‍රමණ 03 ලියා දක්වන්න.
4. ආචාර පෙළපාළියක ප්‍රධාන ගමන් ක්‍රම 02 ලියා දක්වන්න.
5. ආචාර පෙළපාළිය විවිධ අවස්ථාවන්හිදී භාවිත වන ක්‍රියාවන් 03ක් ලියා දක්වන්න.

(05) මනස භාවිත කර සිදුකරන විවිධ ක්‍රීඩා මගින් අපට අපගේ මනස සංවර්ධනය සිදුකර ගතහැකි අතර කායික ක්‍රියාකාරකම් මගින් අපගේ කායික සංවර්ධනය සිදුකරගත හැකිය.

1. ක්‍රීඩා කිරීමේ වාසි 02ක් ලියා දක්වන්න.
2. මහා ක්‍රීඩා 03ක් ලියා දක්වන්න.
3. සංවිධානාත්මක ක්‍රීඩා යනු මොනවා ද?
4. ජන ක්‍රීඩා සඳහා උදාහරණ 02ක් සඳහන් කරන්න.
5. සංවිධානාත්මක ක්‍රීඩා සිදුකිරීමේ වාසි 03ක් කෙටියෙන් ලියා දක්වන්න.

(06) මෙම රූප සටහනින් දක්වා ඇත්තේ වොලිබෝල් ක්‍රීඩා පිටියයි.




1. මෙහි දිග සහ පළල දක්වන්න.
2. (අ) මෙහි රේඛා අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමඟ නම් කරන්න.
   (ආ) මෙහි කලාප අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමඟ නම් කරන්න.



3. ඉහත දක්වා ඇති පිරිනැම්මේ ආකාරය කුමක් ද?
4. උඩු අත් එසවීමේ ශිල්පීය ක්‍රමයේ ප්‍රධාන අවස්ථා තුනක් නම් කරන්න.

(07) බොහෝ ලෙඩ රෝග වලට හේතු වන්නේ වැරදි ආහාර පරිභෝජන රටාව වේ.

1. බෝ නොවන රෝග 4ක් ලියන්න.
2. බෝ නොවන රෝග වලින් ආරක්ෂා වීමට අපට ගත හැකි ඉහත සඳහන් නොවන හේතු 4ක් ලියන්න.